පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- :- ගණිතය

සතිය- 9 (3 වාරය)

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය:- 8

(ඉගෙනුම් කාලය :- පැය 3 මිනිත්තු 20 )

## දත්ත නිරූපණය හා අර් ථකථනය

- 6 හා 7 ශ්‍රේණි වලදී උගත් චිත්‍ර ප්‍රස්තාර, තීර ප්‍රස්තාර, බහුතීර ප්‍රස්තාර මගින් දත්ත නිරූපණය කළ ආකාරය, එම ප්‍රස්තාර වලින් නිරූපිත දත්ත අථර්කථනය කළ ආකාරය සිහිපත් කර ගන්න.

27.1 වෘන්ත පත්‍ර සටහන

- වෘන්ත පත්‍ර සටහන යනු දත්ත සටහන් කිරීමේ ක්‍රමයකි. සංඛ්‍යා මගින් දැක්වෙන දත්ත සමූහයක් අර්-ථකථනය පහසු කිරීම සඳහා මෙම පිළිගත් ක්‍රමයට දත්ත සටහන් කරනු ලැබේ.
- දත්ත සමූහයේ දත්තයන්ගේ අගයන් 0 සිට 99 දක්වා පවතින්නේ නම් එක් එක් අගයේ එකස්ථානයේ ඉලක්කම පත්‍රය ලෙසටත් දසස්ථානයේ ඉලක්කම වෘන්තය ලෙසටත් ලියා දක්වනු ලැබේ.
- දත්ත සමූහයේ දත්තයන්ගේ අගයන් 100 සිට 999 දක්වා පවතින්නේ නම් එක් එක් අගයේ එකස්ථානයේ ඉලක්කම පත්‍රය ලෙසටත් දසස්ථානයේ සහ සියස්ථානයේ ඉලක්කම් වෘන්තය ලෙසටත් ලියා දක්වනු ලැබේ.
- පත්‍රයට ලියා දැක්විය හැක්කේ පූර් ණ සංඛ්‍යාවල එකස්ථානයේ ඉලක්කම පමණි. 0 සිට 9 තෙක් සංඛ්‍යාවල වෘන්තය 0 ලෙස සලකනු ලැබේ. එක පේළියක පත්‍ර එකකට වඩා ඇත්නම් ඒවා පරතර ඇතිව ලියනු ලැබේ. පත්‍ර කොටසේ එක් එක් පේළි වල ඉලක්කම් ආරෝහණ පිළිවෙළට ලියා දැක්විය යුතුය.
- පෙළ පොතේ (2 කොටස) 124,125,126,127 පිටු අධ්‍යයනය කර 27.1 අභ්‍යාසය කරන්න.

27.2 වෘන්ත පත්‍ර සටහනකින් නිරූපිත දත්තවල විසිරීම

- දත්ත සමූහයක් වෘන්ත පත්‍ර සටහනකින් නිරූපණය කල විට එහි පත්‍ර කොටසේ පළමු පේළියේ මුල්ම ඉලක්කමට අදාළ දත්තය දත්ත සමූහයේ අවම අගය වේ. අවසන් පේළියේ අවසාන ඉලක්කමට අදාළ දත්තය දත්ත සමූහයේ උපරිම අගය වේ.
- දත්ත සමූහයක අගයන්ගේ උපරිම අගය හා අවම අගය අතර වෙනස එම දත්ත සමූහයේ පරාසය ලෙස හැඳිනවේ.
- 128,129 පිටු අධ්‍යනය කර 27.2 අභ්‍යාසය කරන්න.